# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1991 අංක 46 දරන කල්එළිය මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලයීය පාලක සමිතියේ පාලක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1991 දෙසැම්බර් මස 17 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**


1991 දෙසැම්බර් මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

**මිල: ශත 60 යි.** **තැපැල් ගාස්තුව: රු. 1.00 යි.**

## 1991 අංක 46 දරන කල්එළිය මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලයීය පාලක සමිතියේ පාලක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1991 දෙසැම්බර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ.76/88

**කල්එළිය මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලයීය පාලක සමිතියේ පාලක මණ්ඩලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"කල්එළිය මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලයීය පාලක සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සමිතියක් එකී කාන්තා අරාබි විද්‍යාලය ද ඊට අනුබද්ධ ආයතන වන "දාරුල් අයිතාම්" (මුස්ලිම් කාන්තා නිවාසය) හා "දාරුල් අත්fපාල්" (ළමා නිවාසය) සහ එම විද්‍යාලයට අනුබද්ධ අතිකුත් ශාඛා කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම සඳහා මෙතෙක් කල් කල්එළියේ පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සමිතිය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් ද:

එකී සමිතිය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1991 අංක 46 දරන කල්එළිය මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලයීය පාලක සමිතියේ පාලක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට හා ඉන්පසු පනතේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලබන්නා වූ ද දැනට කල්එළියේ මුස්ලිම් කාන්තා ආරාබි විද්‍යාලයීය පාලක සමිතියේ පාලක මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් කටයුතු කරන්නා වූ සහ මින් මතු මේ පනතින් සංස්ථාපනය කෙරෙන සංස්ථාවේ සාමාජිකයින් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) "කල්එළියේ මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලයීය පාලක සමිතියේ පාලක මණ්ඩලය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන අතර, එම නාමයෙන් එය විසින් හා එයට විරුද්ධ ව ද ඕනෑම අධිකරණයක නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය. කල්එළිය මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලයීය පාලක සමිතියේ පාලක මණ්ඩලය සංස්ථාගත කිරීම.

මණ්ඩලයේ පොදු පරමාර්ථ.

3. මණ්ඩලයේ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ මුස්ලිම් ගැහැණු ළමයින් අතර අරාබි භාෂාව හා ඉස්ලාම් ධර්මය පිළිබඳ අධ්‍යාපනය දියුණු කිරීම;

(ආ) කල්එළියේ පිහිටි මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලයේ හා මණ්ඩලය විසින් සිය අභිමතය පරිදි තීරණය කරනු ලබන එවැනි ස්වභාවයෙන් යුත් වෙනත් ආයතන පරිපාලනය කිරීම, සංවර්ධනය කිරීම, පවත්වාගෙන යාම සහ නඩත්තු කිරීම;

(ඇ) මුස්ලිම් පිරිමි ළමයින් සඳහා වරකාපොල පිහිටුවා ඇති "වරකාපොල මද්රසතුල් හසනාත්" යනුවෙන් හඳුන්වන හා සඳහන් කරන අරාබි අධ්‍යාපන පීඨය පරිපාලනය කිරීම, සංවර්ධනය කිරීම, පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම;

(ඈ) කල්එළිය මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාල භූමියේම පිහිටුවා ඇති දාරුල් අයිතාම් (මුස්ලිම් කාන්තා ළමා නිවාසය) හා දාරුල් අත්fපාල් (මුස්ලිම් ළමා නිවාසය) සංවර්ධනය කිරීම, පරිපාලනය කිරීම, පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම;

(ඉ) එකී අරාබි විද්‍යාලයේ දාරුල් අයිතාම්, දාරුල් අත්fපාල්, හා මද්රසතුල් හසනාත් යන ආයතනයන්හි ශාඛා හෝ ඒවාට අනුබද්ධ වෙනත් නිවාස පරිපාලනය කිරීම, සංවර්ධනය කිරීම, පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම; සහ

(ඊ) ඉහත කී පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් ඉටු කර ගැනීම සඳහා අනුෂංගික හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

මණ්ඩලයේ බලතල.

4. (1) මණ්ඩලයේ යම් මහා සභා රැස්වීමකදී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල මණ්ඩලය විසින් රීති සෑදීම නීත්‍යනුකූල වන්නේය:—

(අ) මණ්ඩලයේ අනුකාරක සභාවලද නිලධාරීන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයින්ගේ ද කාර්ය ඉටු කිරීම;

(ආ) මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය සේවකයින් අනුයුක්ත කිරීම, පත් කිරීම සහ ඔවුන්ගේ සේවය අවසන් කිරීම;

(ඇ) ශිෂ්‍යයින් බඳවා ගැනීම, ඔවුන්ගේ ගාස්තු නියම කිරීම හා අය කිරීම, දුගී දුප්පත් ශිෂ්‍යයින් සඳහා සහන සලසා දීම හා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම;

(ඇ) ගණන් තැබීම, මුදල් තැන්පත් කිරීම, මුද්‍රාව තබා ගැනීම සහ ලේඛනවලට මුද්‍රාව තැබීම ;

(ඉ) මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) මණ්ඩලයේ සාමාජිකයන් මණ්ඩලයේ රීතිවලට යටත් විය යුතු ය.

මණ්ඩලය විසින් නිශ්චල හා චංචල දේපළ දැරිය හැකි බව.

5. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, මුදල් බැහැර කිරීමක් හෝ වෙනත් ආකාරයක් මගින් මණ්ඩලය වෙත සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත් කර ගැනීමට සහ දැරීමට මණ්ඩලයට බලය ඇත්තේය. තවද එවැනි සියලු චංචල හා නිශ්චල දේපළ විකිණීම, උකස් තැබීම, බද්දට දීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම මේ පනතේ කාර්ය සඳහා මණ්ඩලයේ තත් කාලයේ රීතිවලට යටත්ව මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය.

මණ්ඩලය විසින් ගෙවිය යුතු සහ සංස්ථාව වෙත අය විය යුතු ණය.

6. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී සමිතියේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවිය යුතු අතර සමිතියට එදිනට අය විය යුතු සියලුම ණය හෝ ගෙවිය යුතු දායක මුදල් හා ආධාර මුදල් මේ පනතේ කාර්ය සඳහා මණ්ඩලයට ගෙවිය යුතු ය.

මණ්ඩලයේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

7. මණ්ඩලයේ රීතිවලින් විධිවිධාන සලස්වනු ලැබ ඇති තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිටදී මිස මණ්ඩලයේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර එකී තැනැත්තන් තමන් පැමිණ සිටීමේ සළකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතුය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

8. මේ පනතෙහි සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන්ගේ මාර්ගයෙන් හෝ, ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ, යම් රාජ්‍ය මණ්ඩලයක හෝ, සංස්ථාවක හෝ, වෙන යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම් වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

## උපලේඛනය

[2 වන වගන්තිය]

(1) අල්හාජ් මොහොමඩ් අලි මොහොමඩ් අබූල් හසන්, වරකාපොල.

(2) අල්හාජ් අලි තම්බි හමීඩ් ලෙබ්බේ අහමඩ් සලීම්, කල්එළිය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.